විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (13)
W.A. විමලසේන සර් - 2022. 02. 20
**(12.30 – 3.30)**

# විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ආකෘති



විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ආකෘති ගණනාවක් විෂයමාලා විශේෂඥයින් විසින් ඉදිරිපත් කර ඇත. පහත දැක්වෙන්නේ විෂය මාලා ක්‍රියාත්මක කිරීමේ ආකෘති කිහිපයකි. ඒ අනුව,

1. වෙනස සඳහා බාධක මගහැරවීමේ ආකෘතිය
2. සංවිධානාත්මක සංවර්ධන ආකෘතිය
3. අපේක්ෂා මූලික ප්‍රතිග්‍රහණ ආකෘතිය
4. සංවිධානාත්මක කොටස් ඒකක හා සම්බන්ධතා ආකෘතිය
5. අධ්‍යාපනික වෙනස්කම් සඳහා ආකෘතිය

යනුවෙනි. මෙම ආකෘති විස්තරාත්මකව පහත දැක්වේ.

## 1. වෙනස සඳහා බාධක මගහැරවීමේ ආකෘතිය

විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ ආකෘති වලින් පළවෙනි ආකෘතිය ලෙස හැඳින්විය හැකි වෙනස සඳහා බාධක මගහැරවීමේ ආකෘතිය දැක්විය හැක. මෙම ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ නීල් ග්‍රෝස් (Neel Gross) නැමැති අධ්‍යාපනඥයා විසිනි. ඔහු විසින් ඉදිරිපත් කර ඇති මෙම ආකෘතිය තුළින් අවධාරණය කරනු ලබන්නේ ගුරුවරයාගේ පුද්ගල අවශ්‍යතාවයන් ක්‍රියාත්මක වීම සම්බන්ධවයි. මෙමගින් ගුරුවරයා පිළිබඳවත්, ගුරුවරයාගේ දැක්ම පිළිබඳවත් අවධාරණය කරයි.

ගුරුවරයාගේ දැක්ම යනු - පන්ති කාමරය තුළ යහපත් ආකල්ප සංවර්ධනාත්මක ලෙස බැලීමයි.

මෙහිදී වැඩිවශයෙන්ම අවධාරණය වන්නේ ගුරුවරයාගේ පුද්ගල අවශ්‍යතාවයන් ක්‍රියාත්මක වීම පිළිබඳවයි. එහිදී ගුරුවරයාගේ පුද්ගල අවශ්‍යතාවයන් ඉහළ මට්ටමකින් ක්‍රියාත්මක කිරීම තුළින් විෂයමාලාවේ අලුත්බවක් (නව්‍යතාවයක්) ඇතිකරනු ලබයි. ඒ අනුව ගුරුවරයාගේ මෙම දැක්ම (සංජානනය) පියවර 04 කට ලැයිස්තු ගත කර ඇත. ඒ අනුව,

1. අසම්බන්ධිත අපේක්ෂා (සම්බන්ධිත නොවන අපේක්ෂා)
2. පෞද්ගලික අපේක්ෂා
3. කාර්යය සම්බන්ධිත අපේක්ෂා
4. බලපෑම් ආශ්‍රිත අපේක්ෂා

යනුවෙනි.

1. <u>අසම්බන්ධිත අපේක්ෂා (සම්බන්ධිත නොවන අපේක්ෂා)</u>

මෙහිදී ගුරුවරයා වෙනස පිළිබඳව දැන ගන්නා නමුදුද එය තමාගේ ජීවිතයට සම්බන්ධ වන ආකාරය නොදකී. එනම් විෂය මාලාව පිළිබඳව සිතන්නේ නැත. තමන්ගේම බවට පත්කර ගැනීමට උත්සාහ ගන්නේද නැත.එබැවින් කුමන වෙනසක් පැවතියද ගුරුවරයා වැඩි බලපෑමක් නොදක්වයි.

2. <u>පෞද්ගලික අපේක්ෂා</u>

මෙයින් අදහස් කරන්නේ පෞද්ගලිකව නව විෂය මාලාව තමාට බලපාන ආකාරය පිළිබඳව සැලකිළිමත් වීමයි. තමන්ගේ විෂයට අදාළ දැනුවත්වීම්, වෙනස්වීම්, නවීකරණයන් පිළිබඳව පෞද්ගලිකව සිතන ආකාරය මෙමගින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස ඉංග්‍රීසි ගුරුවරයා online lerning පිළිබඳව ඇති දැනුම පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිතා කිරීම ගත හැකිය.

3. <u>කාර්යය සම්බන්ධිත අපේක්ෂා</u>

මෙයින් අදහස් කරන්නේ ගුරුවරයා නව විෂයමාලාව භාවිතා කරන්නේ කෙසේද යන්න සිතයි. එසේම නව විෂයමාලාව ඉගෙනීමට කොපමණ කාලයක් ගතවේද යන්න සිතයි. එමෙන්ම විෂයමාලා නවීකරණයේදී ඉගැන්වීමේදී හොදම ක්‍රමය කුමක්ද යන්න සිතයි. එපමණක්ද නොව විෂයමාලා වෙනස්කම් වලට කුමන සහයක් ලබා දිය යුතුද, ඒවාට කුමන ආකාරයෙන් මැදිහත්විය යුතුද යන්න අවධාරණය කරයි. ඉහත සියල්ලම කාර්යය සම්බන්ධිත අපේක්ෂණ ලෙස හදුන්වනු ලබයි.

4. <u>බලපෑම් ආශ්‍රිත අපේක්ෂා</u>

මෙයින් අදහස් කරන්නේ ගුරුවරුන් තමන්ගේ කාර්යයන් ඉටුකරන අතර මෙම නවීකරණය සිසුන්ට, පාසලට බලපාන ආකාරය පිළිබඳව සිතයි. එසේම මෙය ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරණ අනෙකුත් ගුරුවරුන්ට සහය දක්වයි. වෙනස්කම් පිළිබඳව නිරන්තර අවධාරණය කරයි.

එමෙන්ම වෙනස සිදුවන ආකාරය පිළිබඳව ක්‍රියාත්මක වේ. ප්‍රතිචාර දක්වයි. එමගින් වෙනස්කම් පිළිබඳව අවධානයෙන් කටයුතු කරයි.

## 2. සංවිධානාත්මක සංවර්ධන ආකෘතිය

සංවිධානාත්මන සංවර්ධන ආකෘතිය යනුවෙන් අදහස් කරන්නේ පාසලේ කණ්ඩායම් වැඩ හා බැඳුණු සංවිධානාත්මක ක්‍රියාවලියකි. මෙම සංවිධානාත්මක සංවර්ධන ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ 'මැතිව් මිලර්' නම් අධ්‍යාපනඥයා විසිනි.

මෙයින් මූලිකවම අදහස් කරන්නේ සාමූහිකව නිර්ණය කිරීමෙන් හා කළමණාකරණය කිරීම මගින් සංවිධානයන්ගේ ගැටලු විසඳීම පිළිබඳ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට යොදා ගන්නා උපායකි. මෙයින් අවධාරණය කරන්නේ කණ්ඩායම් කාර්යයන් හා සංවිධානාත්මකව ගැටලු විසඳීමේ ක්‍රියාවලියයි. උදාහරණයක් ලෙස පාසලේ විෂයමාලාව ක්‍රියාත්මක වීම සම්බන්ධ කණ්ඩායමක් සිටී. එනම් <u>පරිපාලකයින්, අධ්‍යක්ෂකවරුන්, අධීක්ෂකවරුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්</u> පාසලේ විෂයමාලාව ඉගැන්වීම සම්බන්ධව සාකච්ඡා කිරීම්, නව වැඩ සටහන් සකස් කිරීම, නව අදහස් ලබා ගැනීම හා ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියක් සිදුකිරීම මගින් සාර්ථක ලෙස විෂය මාලාව ක්‍රියාත්මක කළ හැකිය.

ඒ තුළින් උපරිම ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විෂයමාලාව සමග සම්බන්ධව ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාත්මකවීම සංවිධානාත්මක සංවර්ධන ආකෘතිය ලෙස තවදුරටත් විස්තර කළ හැකිය.

## 3. අපේක්ෂා මූලික ප්‍රතිග්‍රහණ ආකෘතිය

මෙයින් අදහස් කරන්නේ වෙනස පිළිබඳව අවශ්‍ය ඕනෑම අයෙකුට භාවිතා කළ හැකි ආකෘතියක් වන අතර වෙනස්වීම පිළිබඳ අවධානය යොමුවන ආකෘතියකි. අපේක්ෂා මූලික ප්‍රතිග්‍රහණ ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ <u>ෆුලර් (Fuller)</u> නැමැති අධ්‍යාපනඥයා විසිනි. ඔහු මෙම ආකෘතියෙන් පැහැදිළි කරන්නේ තමන් වෙනසකට භාජනය වන්නේ කෙසේද යන්නයි.

මෙම ආකෘතිය අනුව වෙනස සඳහා දක්වන සම්බන්ධ වන අයට පහත දැක්වෙන ප්‍රශ්න නගා ගත හැකිය. ඒ අනුව,

- වෙනස යනු කුමක්ද ?
- එය මට බලපාන්නේ කෙසේද ?
- මා එය සිදු කරන්නේ කෙසේද ?
- මෙම සම්පත් ඵලදායීව යොදා ගන්නේ කෙසේද ?
- මෙම කටයුතු මා සංවිධානය කර ගන්නේ කෙසේද ?
- ඒ සඳහා කොපමණ කාලයක් ගතවන්නේ ඇයි ?

මෙම ආකෘතියේදී අවධි 07 ක් පිළිබඳව තක්සේරු කරනු ලබනු බව පෙන්වා දෙයි. පහත දැක්වෙන අවධි 07 මෙසේය. ඒ අනුව,

- දැනුවත් කිරීම
- තොරතුරු ලබා ගැනීම
- පෞද්ගලිකත්වය පිළිබද සොයා බැලීම
- කළමණාකරණය පිළිබඳව සැළකිලිමත් වීම
- ප්‍රතිඵලය පිළිබඳව සැළකිළිමත් වීම
- සාමූහික බව
- නැවත සලකා බැලීම

ඒ අනුව මෙම ආකෘතියේ මෙම අවධි 8 පිළිබඳව ගුරුවරයා තක්සේරු කර ගන්නේ නම් වෘත්තීය සංවර්ධනය සඳහාද උපකාරී වේ. මෙයින් වැඩි වශයෙන්ම අවධානය යොමු කරවන්නේ සිසුන්ගේ ඉගෙනුමට පෙර ගුරුවරුන් සම්පත් සහ උපාය මාර්ග (අනුගමනය කරනු ලබන විවිධ උපක්‍රම, සැලසුම්, ආකෘති සහ ඉගැන්වීමේ ක්‍රම)හුරුවක් ලබා තිබිය යුතු බවයි. මේ ආකාරයට අපේක්ෂා මූලික ප්‍රතිග්‍රහණ ආකෘතිය ඕනෑම අයෙකුට භාවිතා කළද හැකිවේ. එනම් ප්‍රතිපත්ති සම්පාදකයින්, ගුරුවරුන්, අධ්‍යාපනඥයින්, දෙමාපියන්, ප්‍රජාව, සිසුන් ආදීන්ය.එමෙන්ම මෙම ආකෘතිය මගින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයක් මෙන්ම න්‍යාමනයක්ද සිදුකළ හැකි බව පැහැදිළි වේ.

## 4. සංවිධානාත්මක කොටස් ඒකක හා සම්බන්ධතා ආකෘතිය

මෙයින් අදහස් වන්නේ සංවිධානයේ එක පද්ධතියක් ලෙස එකතු කිරීමක් යන අදහසයි. මෙම ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ රෙක්සිස් ලයිකට් නැමැති අධ්‍යාපනඥයා විසිනි. මෙයින් අදහස් වන්නේ සමස්තයේ කොටස් අතර සම්බන්ධතා ගොඩනගා ගන්නා සංවිධානයක් පිළිබඳවයි. විෂයමාලා සංවිධානයේදී විවිධ කොටස් අතර සම්බන්ධය නැතහොත් සබදතා ජාලය ඉතා වැදගත් වේ.

පරිපාලකයින්, ගුරුවරුන්, අධීක්ෂතවරුන්, සිසුන්, ප්‍රජාව මෙම ආකෘතියේ ප්‍රධාන ක්‍රියාකාරීන් වේ. එහිදී එකිනෙක කොටස් අතර සම්බන්ධතා ගොඩනංවා ගැනීම (Link) කළයුතුය. එසේ ගොඩනගාගත් විට ක්‍රියාත්මක කිරීම සිදුවේ. එමේන්ම සංවිධානයේ සංවර්ධනයක්ද ඇතිවේ. සැබැලෙස විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ පහසුවද ලැබේ. විෂයමාලා නවීකරණයන් වලදීද මෙම කණ්ඩායමේ සහය ඉතා වැදගත් වේ.

## 5. අධ්‍යාපනික වෙනස්කම් සඳහා ආකෘතිය (Education Change Methord/ Model)

මෙම ආකෘතිය තුළින් අපේක්ෂා කරන්නේ අධ්‍යාපනික වෙනස්කම් පිළිබඳව නව අර්තයක් (අදහසක්) ඉදිරිපත් කිරීමයි. මෙම ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ මයිකල් ෆුලන් (Fullen) නමැති අධ්‍යාපනඥයා විසිනි.

මෙම අධ්‍යාපනික වෙනස්කම් පිළිබඳව නව අර්ථයක් ඉදිරිපත් කර වෙනස්කම් සඳහා ඇති වන බාධාවන්ද හඳුන්වා දී ඇත. අධ්‍යාපනික පද්ධතිය ශිෂ්‍යාගේ සිට රාජ්‍යය දක්වා විහිදේ. ශිෂ්‍යාගේ සිට රජය දක්වා පරාසයක තුළ සම්බන්ධ වන පුද්ගලයන්ගේ භූමිකා ( විපර්යයකාරකයන්) සහ විෂයමාලාව නවීකරණය අතර වෙනස බලපාන බව පෙන්වා දෙන ලදී. මයිකල් ෆුලන්ට අනුව වෙනස් කිරීමේ ක්‍රියාවලිය ප්‍රධාන අවධි මයිකල් ෆුලන් 04 කට බෙදා දැක්වේ. ඒ අනුව ,

ආරම්භය ⟷ මෙහෙයවීම ⟷ අඛන්ඩතාවය ⟷ අවසන්ඵල

ඔහු මෙහිදී ආරම්භක අවධියට සම්බන්ධව බලපාන සාධක 05 ක් ඉදිරිපත් කරයි.

- නවීකරණය ගුණාත්මකබව
- නවීකරණයට පිවිසීම
- පරිපාලන සහාය
- ගුරු සහය
- භාහිර සාධක

මෙම ආකෘතිය අනුව නවීකරණයට භාජනය වන විපර්යයකාරකයන්ගේ භූමිකා ඉතා පැහැදිළි ලෙස හඳුනාගත යුතු බවයි. එහිදී වෙනස්වීමේ අවශ්‍යතාවය, වෙනස්වීමේ පැහැදිළිකම, වෙනස ඉදිරියට ගෙන යැම සහ වගකීම සහ වැඩසටහනේ ගුණාත්මක බව සහ ප්‍රායෝගික බව මෙහිදී අවධාරණය කරනු ලැබේ. මේ ආකාරයට අධ්‍යාපනික වෙනස්කම් සඳහා වූ ආකෘතිය මයිකල් ෆුලන් විසින් පැහැදිළි කර දී ඇත.

<u>ප්‍රශ්නය</u>

1. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ඔබගේ අදහස් දක්වන්න.
2. විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ආකෘති කීයද ඒවා මොනවාද
3. ඉන් එක් ආකෘතියක් පිළිබඳව ඔබගේ අදහස් විෂය මාලාව, ගුරුවරයා, විදුහල්පතිවරයා යන භූමිකා ඔස්සේ පැහැදිළි කරන්න.